| | | |
|---|---|---|
| දුරකථන / தொலைபேசி / Telephones | 011-2136600<br>011-2136650 | |
| ලේකම් / செயலாளர் / Secretary | 011-2136602 | |
| ෆැක්ස් / தொலைநகல் / Fax | 011-2876169<br>011-2876181 | |
| විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E - mail | info@psc.gov.lk | |
| වෙබ් අඩවිය / இணையத்தளம் / Website | www.psc.gov.lk | |

**රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය**
**பகிரங்க சேவை ஆணைக்குழு அலுவலகம்**
**OFFICE OF THE PUBLIC SERVICE COMMISSION**

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
இல. 1200/9, இரஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
No. 1200/9, Rajamalwatta Road, Battaramulla.


මගේ අංකය / எனது இல. / My No.: PSC/APL/14/AT/Principal 2026

ඔබේ අංකය / உமது இல. / Your No.: ED/04/60/01/වා.ස්.මා-2025

දිනය / திகதி / Date: 2026.03. 13

**ලේකම්**
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

**<u>2025 වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අභියාචනාවලට අදාළ තීරණ දැනුම් දීම</u>**
**<u>ශ්‍රී ලංකා විදුහල්පති සේවය</u>**

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධරයන් සම්බන්ධයෙන් ඔබ විසින් අනුමත කරන ලද 2025 වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනාවලට අදාළව එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ මේ සමඟ එවමි.

02) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණ ලබා දී ඇති මෙම අභියාචනා අතරින් ස්ථාන මාරු ක්‍රියාත්මක විය යුතු දිනය සම්බන්ධයෙන් විශේෂයෙන් සඳහන් කර නොමැති සියලු ස්ථාන මාරු 2026.04.02 දින සිට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස ඔබ වෙත කාරුණිකව දන්වා සිටිමි. ඒ අනුව, ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධරයන්ගේ 2025 වර්ෂයට අදාළ වාර්ෂික ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කරන ලෙසත්, වාර්ෂික ස්ථාන මාරුවීම් ලද නිලධරයින් මේ සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙසත් මෙයින් දන්වමි. ස්ථාන මාරු ක්‍රියාත්මක වීම සඳහා වෙනත් නිශ්චිත දිනයක් ලබා දී ඇති ස්ථාන මාරුවීම් ද එම දින සිට අනිවාර්යයෙන් ම ක්‍රියාත්මක විය යුතු වේ.

03) එක් එක් නිලධරයා සම්බන්ධයෙන් වෙන වෙන ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ දන්වා එවීමට කටයුතු කරනු නොලැබේ. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ ස්ථාන මාරු අභියාචනයන්ට අදාළ නියෝග ප්‍රසිද්ධ කිරීමට අවශ්‍ය පියවර ගනු ලබන බව මෙයින් දන්වා සිටිමි. මේ සම්බන්ධයෙන් 2006 අංක 19 දරණ ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 2 (ඇ) සහ (ඈ), 3 සහ 4 යන වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

04) රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සම්බන්ධයෙන් එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණයකින් අතෘප්තියට පත්වන රජයේ නිලධරයකුට 2002 අංක 04 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනතේ විධිවිධානවලට අනුකූලව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේ ය. එසේ වුවද, ඉදිරිපත් කරනු ලබන අභියාචනා සඳහා පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ අවසන් තීරණයක් ලැබෙන තෙක් නොසිට ලබා දී ඇති ස්ථාන මාරු නියෝගය එලෙස ම ක්‍රියාත්මක විය යුතු බව ද කාරුණිකව දැනුම් දෙමි.

05) 2025 වාර්ෂික ස්ථාන මාරු නියෝග ලබා සිටින සියලුම නිලධරයන් නියමිත දිනයේ නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකි වන පරිදි අනුප්‍රාප්තිකයින් පැමිණෙන තෙක් රඳවා නොගෙන වර්තමාන සේවා ස්ථානවලින් මුදා හැරීමට කටයුතු කිරීම ඔබගේ සහ සියලුම ආයතන ප්‍රධානීන්ගේ වගකීම වන අතර, එය නිවැරදිව සිදු වන්නේ ද යන්න පිළිබඳව පුළුල් අධ්‍යයනයක් හා පසු විපරමක් සිදු කරන ලෙස ද ඔබ වෙත දන්වා සිටිමි.

06) වාර්ෂික ස්ථාන මාරු නියෝග මත නියමිත පරිදි පූර්ව සේවා ස්ථානයෙන් නිදහස් කරන ලද නමුත් නියමිත පරිදි නව සේවා ස්ථානය වෙත රාජකාරි සඳහා වාර්තා නොකර සිටින නිලධරයකු රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 257 (V) වගන්තිය අනුව, සිය කැමැත්තෙන් තනතුර අතහැර ගියා සේ සලකා තනතුර අතහැර යාමේ නිවේදනයක් නිකුත් කිරීමට කටයුතු කළ යුතු අතර අදාළ ආයතන ප්‍රධානීන් එසේ කටයුතු කරන්නේ ද යන්න පිළිබඳව ඔබ විසින් අධීක්ෂණය කළ යුතු වේ.

07) එසේම, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණ ලබා දී ඇති ස්ථාන මාරු සම්බන්ධව ඉදිරියේ දී ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් හෝ නිර්දේශ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නැවත සලකා නොබලන බව දන්වා සිටින අතර එවැනි ඉල්ලීම් හා නිර්දේශ තවදුරටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් නොකරන ලෙස ද වැඩිදුරටත් දන්වා සිටිමි.

Nday

**ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න**
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු තීරණ සම්බන්ධයෙන් වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ - 2025

| අංකය | නම | තනතුර | වර්තමාන සේවා ස්ථානය | ස්ථාන මාරු ලද සේවා ස්ථානය | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය |
|---|---|---|---|---|---|
| 1 | සී.එල්.කේ. මාගම්මන මයා | ශ්‍රී ලංකා විදුහල්පති සේවය - 2 | පො/තෝපාවැව ම. වි. | පො/ආනන්ද බාලිකා ජාතික පාසල | අභියාචනය නිෂ්ප්‍රභ කරමින් ස්ථාන මාරු නියෝගය ක්‍රියාත්මක කිරීම |
| 2 | ආර්.අයි.ඩී.ජේ. රත්නමලල මයා | ශ්‍රී ලංකා විදුහල්පති සේවය - 1 | අ/ස්වර්ණපාලි බාලිකා ජාතික පාසල | අනු/කැකි/විද්‍යාර්ථ මධ්‍ය විද්‍යාලය | අභියාචනය නිෂ්ප්‍රභ කරමින් ස්ථාන මාරු නියෝගය ක්‍රියාත්මක කිරීම |
| 3 | පී.එම්.එම්.ජී. කරුණාරත්න බණ්ඩා මයා | ශ්‍රී ලංකා විදුහල්පති සේවය - 2 | පො/රාජකීය ම.ම. වි. | පො/මින්නේරිය ජාතික පාසල | අභියාචනයට ඉඩ දෙමින් ස්ථාන මාරු නියෝගය අවලංගු කිරීම |
| 4 | එම්.එස්. මනූනා මිය | ශ්‍රී ලංකා විදුහල්පති සේවය - 2 | කමු/මුහම්මද් බාලිකා විද්‍යාලය | අම්/අල් අෂ්රාෆ් මධ්‍ය විද්‍යාලය | අභියාචනය නිෂ්ප්‍රභ කරමින් ස්ථාන මාරු නියෝගය ක්‍රියාත්මක කිරීම |
| 5 | එන්.ඩී. දර්ශන් නදීකා මිය | ශ්‍රී ලංකා විදුහල්පති සේවය - 2 | කමු/මුහම්මද් බාලිකා විද්‍යාලය | අම්/අල් අෂ්රාෆ් මධ්‍ය විද්‍යාලය | අභියාචනයට ඉඩ දෙමින් ස්ථාන මාරු ලද සේවා ස්ථානය මඩ / මීරා බාලිකා මහා විද්‍යාලය ලෙස සංශෝධනය කිරීම |
| 6 | ඒ.එච්. නදීරා මිය | ශ්‍රී ලංකා විදුහල්පති සේවය - 2 | කමු/මුහම්මද් බාලිකා විද්‍යාලය | අම්/අල් අෂ්රාෆ් මධ්‍ය විද්‍යාලය | අභියාචනය නිෂ්ප්‍රභ කරමින් ස්ථාන මාරු නියෝගය ක්‍රියාත්මක කිරීම |
| 7 | එස්.එස්.එම්. මසුතු ලෙබ්බේ මිය | ශ්‍රී ලංකා විදුහල්පති සේවය - 1 | කමු/මුහම්මද් බාලිකා විද්‍යාලය | සමන්තුරේ මුස්ලිම් ම. ම. වි. | අභියාචනය නිෂ්ප්‍රභ කරමින් ස්ථාන මාරු නියෝගය ක්‍රියාත්මක කිරීම |
| 8 | ආර්. උබේවර්ණ මිය | ශ්‍රී ලංකා විදුහල්පති සේවය - 1 | හුංගම විජයබා ජාතික පාසල | හ/ශාන්තමේරි ජාතික පාසල හම්බන්තොට | අභියාචනයට ඉඩ දෙමින් ස්ථාන මාරු නියෝගය අවලංගු කිරීම |
| 9 | කේ.ටී. ප්‍රියන්ති මෙය | ශ්‍රී ලංකා විදුහල්පති සේවය - 2 | මාර/පුහුල්වැල්ල ම. ම. වි. - කිරින්ද | මාර/විජිත මධ්‍ය විද්‍යාලය | අභියාචනය නිෂ්ප්‍රභ කරමින් ස්ථාන මාරු නියෝගය ක්‍රියාත්මක කිරීම |
| 10 | පී.එම්.සී.ඩී. පතිරාජ මිය | ශ්‍රී ලංකා විදුහල්පති සේවය - 1 | ගිරි/නක්කාවත්ත ජාතික පාසල | ගිරි/සඳලංකා ජාතික පාසල | අභියාචනය ප්‍රතික්ෂේප කරමින් ගිරි/නක්කාවත්ත ජාතික පාසල වෙත ස්ථිර විදුහල්පතිවරයෙකු පත් කරන තෙක් මෙම නිලධාරියාගේ ස්ථාන මාරුව ප්‍රමාද කිරීම |
| 11 | එච්.එම්. ධනපාල මයා | ශ්‍රී ලංකා විදුහල්පති සේවය - 2 | හලා/ආනන්ද ජාතික පාසල | කුලි/ශ්‍රී සරණංකර ම. ම. වි. | අභියාචනයට ඉඩදෙමින් ස්ථාන මාරු නියෝගය අවලංගු කිරීම |

| | | | | | |
|---|---|---|---|---|---|
| 12 | එම්.ඒ.ඒ. අබේසිරි මයා | ශ්‍රී ලංකා විදුහල්පති සේවය - 2 | හලා/ආනන්ද ජාතික පාසල | හලා/වෙන්/බෞද්ධ බාලිකා විද්‍යාලය | අභියාචනයට ඉඩදෙමින් ස්ථාන මාරු නියෝගය අවලංගු කිරීම |
| 13 | එස්.ටී.ජේ.එස්. රෝසා මයා | ශ්‍රී ලංකා විදුහල්පති සේවය - 1 | කු/ගිරි/ පන්නල ජාතික පාසල | ගිරි/සඳලංකා ජාතික පාසල | අභියාචනය නිෂ්ප්‍රභ කරමින් ස්ථාන මාරු නියෝගය ක්‍රියාත්මක කිරීම |
| 14 | කේ.කේ. ජගත් අමරසිංහ මයා | ශ්‍රී ලංකා විදුහල්පති සේවය - 1 | කො/නාලන්ද විද්‍යාලය | විද්‍යා විද්‍යාලය, ගල්කිස්ස | අභියාචනය නිෂ්ප්‍රභ කරමින් ස්ථාන මාරු නියෝගය ක්‍රියාත්මක කිරීම |
| 15 | ඩබ්.එම්.එස්.එන්. වාසල මයා | ශ්‍රී ලංකා විදුහල්පති සේවය - 1 | ධර්මපාල විද්‍යාලය, පන්නිපිටිය | කො/නාලන්ද විද්‍යාලය | අභියාචනය නිෂ්ප්‍රභ කරමින් ස්ථාන මාරු නියෝගය ක්‍රියාත්මක කිරීම |
| 16 | ඩබ්.එම්.එස්.එම්. කරුණාරත්න මයා | ශ්‍රී ලංකා විදුහල්පති සේවය - 3 | විද්‍යා විද්‍යාලය, ගල්කිස්ස | කො/ දේවි බාලිකා විද්‍යාලය | අභියාචනයට ඉඩ දෙමින් පුරප්පාඩු පවතී නම් මෙම නිලධාරියා ඉල්ලා ඇති පාසලක් වෙත ස්ථාන මාරුව සංශෝධනය කිරීම. එලෙස පුරප්පාඩු නොමැති නම් ඔහු වෙත ලබා දී ඇති ස්ථාන මාරු නියෝගය අවලංගු කිරීම |
| 17 | ජේ.ඒ.එස්. රාජපක්ෂ මයා | ශ්‍රී ලංකා විදුහල්පති සේවය - 1 | කො/ඉසිපතන විද්‍යාලය | විද්‍යා විද්‍යාලය, ගල්කිස්ස | අභියාචනයට ඉඩදෙමින් ස්ථාන මාරු නියෝගය අවලංගු කිරීම |
| 18 | ටී.ජී.ඒ. ධර්මපාල මහතා | ශ්‍රී ලංකා විදුහල්පති සේවය -1 | කො/ රාජකීය විද්‍යාලය | කුඩාබුත්ගමුව ශ්‍රී රාජසිංහ විද්‍යාලය | අභියාචනයට ඉඩදෙමින් ස්ථාන මාරු නියෝගය අවලංගු කිරීම |
| 19 | ඕ.කේ. මාලා දමයන්ති නානායක්කාර මිය | ශ්‍රී ලංකා විදුහල්පති සේවය - 1 | අලුත්ගම මහා විද්‍යාලය | බෙන්තොට ගාමිණී විද්‍යාලය | අභියාචනය නිෂ්ප්‍රභ කරමින් ස්ථාන මාරු නියෝගය ක්‍රියාත්මක කිරීම |
| 20 | එච්.එම්.වී.එන්. හේරත් මිය | ශ්‍රී ලංකා විදුහල්පති සේවය - 1 | මහ/ශ්‍රී රාහුල විද්‍යාලය - කටුගස්තොට | මහ/විමලධර්ම ජාතික පාසල | අභියාචනය නිෂ්ප්‍රභ කරමින් ස්ථාන මාරු නියෝගය ක්‍රියාත්මක කිරීම |
| 21 | එස්. ශර්මිලා සෙල්වරාජ් මිය | ශ්‍රී ලංකා විදුහල්පති සේවය - 3 | මප/කටු/ ගල්හින්න අල් මනාර් මුස්ලිම් ම. වි. | රජවැල්ල හින්දු ජාතික පාසල | අභියාචනය නිෂ්ප්‍රභ කරමින් ස්ථාන මාරු නියෝගය ක්‍රියාත්මක කිරීම |
| 22 | ජේ.එස්.එම්. ෆවායිදා මිය | ශ්‍රී ලංකා විදුහල්පති සේවය - 2 | මා/අමීනා ජාතික පාසල | මා/සහිරා ජාතික පාසල | අභියාචනයට ඉඩ දෙමින් මා/ අමීනා ජාතික පාසල වෙත ස්ථිර විදුහල්පතිවරයෙකු පත් කරන තුරු ස්ථාන මාරුව ප්‍රමාද කිරීම |
| 23 | එම්.එම්.ජේ.කේ. මීගහකොටුව මිය | ශ්‍රී ලංකා විදුහල්පති සේවය - 2 | නු/ගාමිණී ම. ම. වි. | නු/ශාන්ත ගාබ්රියල් බාලිකා විද්‍යාලය | අභියාචනය නිෂ්ප්‍රභ කරමින් ස්ථාන මාරු නියෝගය ක්‍රියාත්මක කිරීම |
| 24 | ආර්. රාස්සෙල්වම් මයා | ශ්‍රී ලංකා විදුහල්පති සේවය -1 | මා/පාක්කියම් ජාතික පාසල | මා/අජ්මීර් ජාතික පාසල | අභියාචනය නිෂ්ප්‍රභ කරමින් ස්ථාන මාරු නියෝගය ක්‍රියාත්මක කිරීම |
| 25 | ආර්. මලර්මනී මිය | ශ්‍රී ලංකා විදුහල්පති සේවය -1 | නු/ශාන්ත ගාබ්රියල් බාලිකා විද්‍යාලය | අල්-මින්හාජ් ජාතික පාසල හපුගස්තලාව | අභියාචනයට ඉඩදෙමින් ස්ථාන මාරු නියෝගය අවලංගු කිරීම |

| | | | | | |
|---|---|---|---|---|---|
| 26 | එම්.ජී.පී. ආරියසේන මයා | ශ්‍රී ලංකා විදුහල්පති සේවය - 2 | මප/කොත්/ගාමිණී දිසානායක ජාතික පාසල | මප/නු/ව/ශ්‍රී සුමංගල ජාතික පාසල | අභියාචනයට ඉඩ දෙමින් මප/කොත්/ගාමිණී දිසානායක ජාතික පාසල වෙත ස්ථිර විදුහල්පතිවරයෙකු පත් කරන දිනය හෝ 2026.07.01 යන දිනයන්ගෙන් පළමුව එළඹෙන දිනය තෙක් මෙම නිලධාරියාගේ ස්ථාන මාරුව ප්‍රමාද කිරීම |
| 27 | ආර්.එම්. රංජනී මිය | ශ්‍රී ලංකා විදුහල්පති සේවය - 2 | මප/නු/ව/ශ්‍රී සුමංගල ජාතික පාසල | මප/කොත්/ගාමිණී දිසානායක ජාතික පාසල | අභියාචනයට ඉඩ දෙමින් ස්ථාන මාරු සමාලෝචන කමිටුව විසින් ලබා දුන් නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත දැනුවත් කිරීම |
| 28 | ජී.එම්.ඩබ්.එම්.එස්. මුතුකුඩේ මිය | ශ්‍රී ලංකා විදුහල්පති සේවය - 2 | මප/නු/ව/ශ්‍රී සුමංගල ජාතික පාසල | වික්ටෝරියා ජාතික පාසල | අභියාචනයට ඉඩ දෙමින් මෙම නිලධාරිනියව මධ්‍යම පළාත් රාජ්‍ය සේවය වෙත ද්විතීයනය වීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත දැනුවත් කිරීම |
| 29 | ඒ.ඩබ්. නිශාන්ති මැණිකේ මිය | ශ්‍රී ලංකා විදුහල්පති සේවය - 1 | ක/බණ්ඩාරගම මධ්‍ය මහා විද්‍යාලය | පානදුර ශාන්ත ජෝන් විද්‍යාලය | අභියාචනය නිෂ්ප්‍රභ කරමින් ස්ථාන මාරු නියෝගය ක්‍රියාත්මක කිරීම |
| 30 | ඩී.සී.පී. මෙන්ඩිස් මිය | ශ්‍රී ලංකා විදුහල්පති සේවය - 2 | ගා/ජනාධිපති විද්‍යාලය - වලහන්දූව | ගා/තවලම විද්‍යාරාජ ජාතික පාසල | අභියාචනය නිෂ්ප්‍රභ කරමින් ස්ථාන මාරු නියෝගය ක්‍රියාත්මක කිරීම |